## <u>මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සැළැස්ම සඳහා  මහජන  නියෝජනය අපේක්ෂා කරයි</u>

2017  -  2021  කාලසීමාව සඳහා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද අන්තර් අමාත්‍ය කමිටුව,  නව  පස් අවුරුදු මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන සංවිධාන හා සිවිල් සමාජය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ගෙන් නිරීක්ෂණ හෝ අදහස් හා මත ඉල්ලා සිටීමට තීරණය කර තිබේ.

අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට අනුව,  මෙසේ සකසනු ලබන කෙටුම්පත් ක්‍රියකාරී සැලැස්ම 2016  ඔක්තෝබර් මස අවසානයේදී අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලනු ඇත.

2016  සැප්තැම්බර් 01  දින සිට ක්‍රියාත්මක වන පරිදි,  මේ සඳහා වෙනමම වෙබ් පිටුවක්,  විදේශ කටයුතු අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ ආරම්භ කර ඇති අතර www.mfa.gov.lk වෙබ් ලිපිනය ඔස්සේ ඊට ප්‍රවේශ විය හැකිය.

කමිටුවේ පසුබිම,  කමිටුවේ සංයුතිය,  කෙටුම්පත් ක්‍රියාවලියට අදාළ කර ගත යුතු මූලධර්ම,  විශේෂිත තොරතුරු හුවමාරු කර ගත යුතු තේමා යනාදිය පිළිබඳ සවිස්තර තොරතුරු මෙම වෙබ් පිටුවෙහි ඇතුළත් වේ.

මේ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ හෝ අදහස්,  2016  සැප්තැම්බර් මස 14  වන දිනට පෙර යොමු කරන මෙන් මානව හිමිකම් ක්‍රියාකාරී සැළැස්ම පිළිබඳ අන්තර් අමාත්‍ය කමිටුව ඒ  පිළිබඳව උනන්දුවක් දක්වන සියලුම පාර්ශ්වවලින් ඉල්ලා සිටියි.    එම නිරීක්ෂණ හා අදහස්,  nhrap.consultations@mfa.gov.lk යන විද්‍යුත් ලිපිනයට සෘජුවම යොමුකළ හැකිය.

විදේශ කටයුතු අමාත්‍යාංශය
2016  සැප්තැම්බර් 05